**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව 2016 ජූලි 29 දින මහා භාරකාර තැන වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 48.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 44.84 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.5 ක් හෙවත් සියයට 7.26 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 45.45 | 42.12 | 3.33 | 7.33 |
| මූලධන | 2.90 | 2.72 | 0.18 | 6.21 |
| **එකතුව** | **48.35** | **44.84** | **3.51** | **7.26** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### 2.2.1 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.75 | 1.55 | 1.50 | 2.39 | 10.50 | 6.31 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වු ගිණුම් අංක 7002/0000/00/0141/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 1.83 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන ගිණුම් අංක 6000/0000/00/0002/0122/000 දරන ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.55 ක් විය.

## 2.5. විගණන නිරීක්ෂණය

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | නිවාඩු ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | . යාවත්කාලීන කර නොතිබුණි |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 05 ක ට සහ ඉකුත් වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුමකට 2016 මැයි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,821,319 ක් වී තිබුණි.

## 3.3 අයවැය විචලනය

ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන් දෙකින් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් හා සියයට 62 ක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.656,194 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල වී තිබුණි.

## 3.5 අභ්‍යන්තර විගණනය

ව්‍යාපෘති 14 ක් යටතේ ඉටු කළ යුතු කාර්යයන් 67 ක් සඳහා අභ්‍යන්තර විගණනය සැලැසුම් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන විමසුම් 9 ක් නිකුත් කර තිබුණි. වැදගත් විගණන ක්ෂේත්‍රයන් වූ භාර ගිණුම්වල දැක්වෙන ශේෂයන් තහවුරු කර ගැනීම, ආයෝජන ලේඛන, කොටස් සහතික පරීක්ෂා කිරීම, බැංකු තහවුරු ලබා ගැනීම, නිවැරදිව පොලී හා ලාභාංශ ලැබී ඇති බව හා නිවැරදිව ගිණුම් ගත කර ඇති බව තහවුරු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**3.6** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 වර්ෂයට අදාළ එම වාර්තාව 2016 මැයි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7** **බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බැරකම්වල එකතුව රු.261,671 ක් වී තිබුණි.

**3.8** **අනුකූල නොවීම්**

**3.8.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| **(i)** XXIV පරිච්ඡේදයේ 3.17.3 වගන්තිය | 123,440 | ණය මුදල ගෙවා අවසන් වීමට පෙර ඇපකරු විශ්‍රාම ගැනීමට නියමිත වන විට එසේ විශ්‍රාම ගැනීමට පෙර වෙනත් ඇපකරුවෙකු ඉදිරිපත් කරන බවට ලිඛිත පොරොන්දුවක් ණයකරුගෙන් ලබා නොගෙන ණය ප්‍රදානය කර තිබුණි. |
| **(ii)** XXIV පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය | 151,233 | විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ආපසු ගෙවීමට ඇති ණය ශේෂයක් වෙතොත් එම ශේෂය තමාගේ පරිවර්ථිත විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට නැතහොත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය දෙන බවට 23 වැනි පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රය ප්‍රකාරව ලියන ලද අවලංගු කළ නොහැකි පොරොන්දුවකට නිලධාරියාගේ අත්සන් ලබා නොගෙන ණය මුදලක් ප්‍රදානය කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**
**-----------------------------------**

| | | | |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 137 (5) | 6,066,360 | සැපයීම් සම්බන්ධයෙන් වන විට ඒවා පරීක්ෂා කර නිවැරදි ලෙස භාරගෙන ඒ ද්‍රව්‍ය පිළිබඳ ගණන් පෙන්වා තිබෙන බවත්, ඒවා සත්‍යාපනය කිරීමෙන් පසු ගෙවීම් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. |
| **(ii)** | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) | 2,057,558 | එක් අවස්ථාවකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය සීමාව වන රු.100,000 ක් ඉක්මවා අවස්ථා 10 කදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| **(iii)** | මුදල් රෙගුලාසි 371 (5) | 4,138,338 | අවස්ථා 67 කදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම මාස 1 ක සිට මාස 12 ක් දක්වා කාල පරාසයක ප්‍රමාද කිරීම්වලින් පසුව අත්‍රිම නිරවුල් කර තිබුණි. අවස්ථා 20 කදී නිකුත් කර තිබුණු එකතුව රු.480,730 ක අතුරු අග්‍රිම විගණිත දින වනවිටත් පියවා නොතිබුණි. |
| **(iv)** | මුදල් රෙගුලාසි 371(2) | 115,750 | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය යුතු වුවත්, අවස්ථා 2 කදී පෞද්ගලික ආයතන වෙත තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබුණි. |

**3.9 කාර්යසාධනය**
**-----------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**3.9.1 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**
**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රීමා ඉන්දානි ද සොයිසා බුදලය**
**---------------------------------**

2007 අප්‍රේල් 14 දින මිය ගිය ශ්‍රීමා ඉන්දානි ද සොයිසා මහත්මියගේ අත්තිම කැමති පත්‍රයට අනුව බුදල් කාරියගේ අභිප්‍රායන් සාක්ෂාත් කිරීමට 2016 මැයි 30 දින වන විටත් එනම්

බුදල්කාරිය මිය යාමෙන් වර්ෂ 09 ක් ගතවීමෙන් පසුවද දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද බුදල්කාරිය සතු නිවස 2009 අගෝස්තු මාසයේ සිට ගිවිසුම්ගත එකඟතාවයකින් හෝ කුලී අය කිරීමකින් හෝ තොරව බුදලය සතු භාණ්ඩ සමග එවකට දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරිනියකට ලබා දී තිබුණි. ඒ අනුව එම දේපල නැවත දෙපාර්තමේන්තුව භාරයට ලබා ගැනීමට අපොහොසත් වීම මත රාජ්‍ය දේපල අවභාවිතයට පත්කර තිබුණි.

**(ආ) ලබුහේන වත්ත**

-------------------

එන්.ඩී.එස් සිල්වා භාරකාර මණ්ඩලය සතුව තිබූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි අක්කර 98 කින් යුත් ලබුහේන වත්ත ඉඩම 2011 අගෝස්තු 04 දින මහා භාරකාර තැන සමග එළඹි අංක 1065 දරන ගිවිසුම ප්‍රකාරව මහා භාරකාර තැන පාලන භාරකරු වශයෙන් ක්‍රියා කිරීම සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පාලනයට ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මෙම දේපලෙහි ගොඩමඩ ඉඩම් ප්‍රමාණය ප්‍රධාන භෝග, අතුරු බෝග, වෙනත් ගස් වර්ග, පවතින ගොඩනැගිලි, යන්ත්‍ර, සූත්‍ර හා විශේෂිත තත්ත්වයන් පිළිබඳව ගිවිසුම්ගත එකගතාවට පැමිණ නොතිබුණි.

(ii). දේපල සංවර්ධනය කිරීම සඳහා එන්.ඩී.එස් සිල්වා භාරකාර මණ්ඩලයෙන් මූල්‍යමය දායකත්වයක් ලබා නොගෙන දේපල භාරගෙන තිබුණි. වෙනත් භාර බුදල් සතු මුදලින් රු.6,382,565 ක් ලබුහේන වත්ත වෙනුවෙන් විගණන දින වන විට වියදම් කර තිබුණි. ඉන් රු.1,440,750 ක් නඩු කටයුතු සඳහා වියදම් කර තිබුණි. පාඩු ලබමින් තිබූ හා භුක්තිය නිරවුල් නොවන දේපලක් සම්බන්ධයෙන් කළමණාකරන හා පාලන භාරකරු වශයෙන් දෙපාර්තමේන්තුව වගකීමට බැඳී තිබූ අතර එය දෙපාර්තමේන්තුවට වැය බරක් පමණක් වී තිබුණි.

(iii). ලාභ උපදවන තත්ත්වයක නොතිබියදී විගණන දින වන විට රු.51,000 ක ශිෂ්‍යාධාර ගෙවීම, වියදම් ගොණු අනුව වැය කරන ලද රු.211,811 ක වියදම ලෙජරයේ වියදම් ලෙස සටහන් නොකිරීම, අවස්ථා 15 කදී වැය කරන ලද එකතුව රු.700,465 ක වියදම් හා පොල් කැඩීමේ අත්තිකාරම් ලෙස ගෙවූ රු.770,000 ක වියදම් සඳහා සනාථ කිරීම් නොතිබීම හා 2013 හා 2014 වර්ෂ සඳහා ඉදිරිපත් කළ භාර අවසාන ගිණුම්වල ලබුහේන වත්තට අදාල ගිණුම ඉදිරිපත් කර නොතිබීම නිසා පාලන භාරකරු වශයෙන් දෙපාර්තමේන්තුවේ වගකීම් ඉටු කර නොතිබුණි.

**(ඇ) වනස්ගල්ල වත්ත**

---------------------

2013 අප්‍රේල් 18 දිනැති අංක 4 දරන එකඟතාවය ප්‍රකාරව එන්.ඩී.එස් සිල්වා කළමණාකරන භාරය වෙතින් කුරුණෑගල වෑ උඩ පිහිටි අක්කර 100 කින් පමණ වූ වනස්ගල්ල වත්ත කළමණාකරන හා පාලන භාරකරු වශයෙන් දෙපාර්තමේන්තුව විසින් භාරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වනස්ගල්ල වත්තේ භෞතික තත්ත්වය එනම් මඩ ඉඩම්, වැවිලි භෝග, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර පිළිබඳව ගිවිසුම්ගත එකඟතාවයක නොතිබුණි. ආර්ථික වටිනාකමකින් යුත් ගස්, වට්ටෝරු ගත කර නොතිබුණි.

(ii) උක්ත එකඟතාවයට පැමිණීමේදී මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් වත්ත සංවර්ධනය කල යුතු කාල පරිච්ඡේදය, සංවර්ධනයෙන් පසු නැවත එන්.ඩී.එස් සිල්වා භාරයට වත්ත භාරදීම හා වත්ත සංවර්ධනය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ප්‍රතිලාභ පිළිබඳ ගිවිසුම්ගත වී නොතිබුණි. තවද

වත්ත සංවර්ධනය කිරීම වෙනුවෙන් විගණිත දිනට රු.2,267,293 ක මුදලක් වෙනත් භාර බුදල් සතු මුදල් උපයෝගී කරගෙන වියදම් දරා තිබුණද දෙපාර්තමේන්තුවට හෝ මුල්‍යමය දායකත්වය ලබා දුන් වෙනත් භාරවලට මෙතෙක් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(iii) වත්ත සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවා තිබුණු අතර වත්තේ මුල්‍ය තත්ත්වය හර ශේෂයක පැවැතුණි. නිශ්චිත කාර්යභාරයක් පැවරීමකින් තොරව 2014 සැප්තැම්බර් 17 දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.152,800 ක දීමනා ලබාදී තිබුණි.

### 3.9.2 භාර අරමුණු ඉටු නොකිරීම හා ලාභදායි භාරවලින් වෙනත් භාරවල අරමුණු ඉටු කිරීම

-----------------------------------------------------------------------------------------

ප්‍රමාණවත් ආදායම් තිබියදි භාර අරමුණු ඉටු කිරීම පැහැර හැර තිබූ අවස්ථා 63 ක් හා අරමුණු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ආදායම් භාරයේ නොතිබියදි වෙනත් භාරවල මුදල් උපයෝගී කරගෙන භාර අරමුණු ඉටු කර තිබූ අවස්ථා 8 ක් නිරීක්ෂණය විය.

### 3.9.3 භාර බුදල් ගිණුම් ඉදිරිපත් නොකිරීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා වන භාරබුදල් අවසාන ගිණුම් 2016 ජුනි 30 දින වන විට ද සකස්කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2013 සහ 2014 වර්ෂ සඳහා පිළියෙල කර තිබූ භාර අවසාන ගිණුම්වල මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත් වතුවලට ආදාළ ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව අවසන් ගිණුම් මගින් සියළුම භාරයන් පිළිබඳ නිවැරදි සහ සත්‍ය තත්ත්වයන් පෙන්නුම් නොකරන බව නිරීක්ෂණය විය.

(ඇ) එක් භාරයක් සතුව විවිධ දේපල පවතින විට එම භාරය සඳහා එක් භාර ගිණුමක් පවත්වා ගැනීම වෙනුවට එකිනෙක දේපල වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා තිබුණි.

### 3.9.4 ආයෝජන පොලී

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 සැප්තැම්බර් 01 දින පිහිටවනු ලැබූ පොලිටෙක්නික් භාරයේ (C49) සමුච්චිත මුලධනය (ආයෝජන) රු.1,271,036 ක් වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉදිරියට ගෙන එන ලද ආදායමේ ඌණතාවය රු.496,238 කි. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම අනුව 2013 හා 2014 වර්ෂ සඳහා කිසිදු ආදායමක් ගිණුම්වල පෙන්වා නොතිබුණි. ඒ අනුව ආයෝජන මත පොලී ලබා ගැනීමට සහ ආයෝජන මත ලැබිය යුතු පොලී ආදායම ගිණුම්වල ගැලපීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස් වලින් සියයට 87.56 ක් එනම් රු.30,050,380 ක් කොටස් හිමිකරගෙන ඇතත් ඒ සම්බන්ධව විසර්ජන ගිණුම මගින් හෝ භාර බුදල් ගිණුම් මගින් හෝ කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

## 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ආගමික හා සමාජසේවා පොදු භාර අරමුදල මගින් වියදම් කිරීම**

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවීම වලක්වා ගනිමින් අදාළ වැය විෂයයන්ගෙන් වියදම් දැරීම වෙනුවට ආගමික හා සමාජසේවා පොදු භාර අරමුදලේ අරමුදල් මගින් රු.1,057,723 ක් වියදම් කර තිබුණි.

(ආ) ආගමික සමාජසේවා පොදු භාරය මගින් වැය කර තිබූ රු.400,350 කට අදාළ වියදම් සනාථ කිරීම සඳහා වූ වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.11 අවිධිමත් ගනුදෙනු

--------------------

**වීරසිංහ අබේනායක බුදලය**

-------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීරසිංහ අබේනායක බුදලයට අයත්ව තිබූ බස්නාහිර ගිරුවාපත්තුවේ පොල්මොටේ ගම පිහිටි මෝදරමුණේයාය සහ කදුරුවැකඩ ඒකාබද්ධ ඉඩමේ 'ඒ 'හා' බී' අක්ෂර දරන හෙක්ටයාර 31.0287ක් වූ ඉඩම් ප්‍රමාණය රජයට පවරා ගැනීමට අදාළව ලද රු.16,500,000 ක් වූ වන්දි මුදල දෙපාර්තමේන්තු අරමුණුවලින් බැහැරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එසේම රු.16,500,000 ක් වූ වන්දි මුදල අදාළ භාරය නමින් හඳුනා නොගෙන, 2012 මාර්තු 06 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. මෙම තැන්පතුව සඳහා ලද පොලිය මාසිකව ආගමික සමාජසේවා පොදු භාරයට බැරකිරීම හේතුවෙන් වීරසිංහ අබේනායක බුදලයෙන් ඉපයූ රු.4,516,050 ක පොලී මුදල් එම භාරයට අහිමි වී තිබූ අතර භාරයේ අරමුණු ඉටු කිරීමට නොයොදවා ආගමික සමාජසේවා පොදු භාරය හරහා මහාභාරකාර තැනගේ අභිමතය පරිදි වියදම් කර තිබුණි.

(ආ) එසේ භාරයට අහිමි වූ ආදායම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර භාර අරමුණු ඉටු කිරීමට හැකිවන පරිදි භාරය නමින් තැන්පත් කිරීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) වීරසිංහ අබේනායක බුදලයට අයත් මාතර ගබඩා වීදියේ පුංචි පතහෙ වත්තේ බී අක්ෂරය දරන කැබැල්ලෙන් බෙදූ අංක 03 දරන පර්චස් 32 ක් විශාල ඉඩම සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය.

(i). උක්ත දේපළ 2013 පෙබරවාරි 05 දින අංක 312 දරන බදු ගිවිසුමෙන් මාසිකව රු. 8,000 කට පුද්ගලයෙකුට බදු දී තිබුණි. මෙහිදී මාසික බදු කුලිය තක්සේරු කිරීම සම්බන්ධයෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දින වන විටත්

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විමසා නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් විධිමත් ආකාරයට කටයුතු කර නොතිබුණි.

(ii) උක්ත බදු ගිවිසුමේ කාලය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ අතර ගිවිසුම අළුත් කිරීමට හෝ නව ගිවිසුමකට එළැඹීමට කටයුතු කර නොතිබුණි. තවද 2014 අප්‍රේල් මාසයේ සිට විගණන දිනය දක්වා හිඟ ගෙවල් කුලිය රු.128,000 අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**3.12 පාඩු හා හානි**

2007 ජනවාරි 27 දින වාහනයක් අනතුරට පත් වීමෙන් සිදුවී තිබූ රු.254,038 ක අලාභය අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.13 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාළව පසුගිය වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | **වර්ෂය** | **ඡේද අංකය** | |
| **(අ)** | 2012 | 5.1 | **ප්‍රමුඛ බැංකුවේ මුදල් ආයෝජනය**<br><br>මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින භාර හා බුදල් 40 කට අයත් එකතුව රු.129,052,032 ක මුදලක් 2001 හා 2002 වර්ෂවලදී පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබුණි. එම බැංකුව වසා දැමීමෙන් පසු එම මුදල රජයට අය විය යුතු තැන්පත් ලෙස සලකා, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ රජයට අයත් කොටස් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කර තිබුණි. ආයෝජන සඳහා පවතින සාමාන්‍ය පොළී අනුපාතයන් මත අයවිය යුතුව තිබුණු මිලියන 160 ක පමණ වූ පොළී ආදායම 2015 වර්ෂය අවසානය වන විටත් ලබාගැනීමට නොහැකි වී තිබුණි. |
| **(ආ)** | 2012 | 10.1 | **අම්බුළුවාව පාරිසරික සංවර්ධන හා සංරක්ෂණ භාරය අවිධිමත් පරිදි පරිපාලනය කිරීම**<br><br>අම්බුළුවාව ප්‍රදේශයේ පාරිසරික හා ජෛව විවිධත්වය සංවර්ධනය කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව 2000 සැප්තැම්බර් 01 දින රු.100,000 ක මූලධනයකින් ආරම්භ කරන ලද මෙම භාරයට අදාළ ගිණුමේ විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 11 දිනට රු.22,709,170 ක අයිරා ශේෂයක් විය.<br><br>භාර අරමුණුවලට පටහැනිව පෞද්ගලික වෛද්‍ය බිල්පත් පියවීම වෙනුවෙන් අවස්ථා 02 කදී එකතුව රු.2,802,816 ක් ද, ගුවන් |

ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,296,352 ක් සහ වාහන අළුත් වැඩියාව හා රක්ෂණ වෙනුවෙන් රු.314,731 ක් වශයෙන් එකතුව රු.4,413,899 ක් අවිධිමත් පරිදි භාරයෙන් ගෙවා තිබුණි.

තවද, කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව සහ භාරයෙහි අරමුණුවලට පටහැනිව අවිධිමත් පරිදි අවස්ථා 04 ක දී එකතුව රු.2,300,000 ක මුදලක් ගෙවා තිබුණි.

2010 දෙසැම්බර් මාසයේ දී රු.3,431,400 කට මිලදී ගෙන තිබුණු ජීප් රථයක් 2012 ජනවාරි මාසයේ දී භාරයෙහි කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව සහ නීතිරීති හා රෙගුලාසි වලට පටහැනිව රු.3,400,000 කට විකුණා තිබුණි.

2012 ජනවාරි මාසයේ දී රථයක් මිලදී ගැනීම සඳහා රු.4,000,000 ක මුදලක් ගෙවා තිබුණ ද එම වාහනය මිලදී ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

බැංකුවක ආයෝජනය කර තිබුණු රු.15,000,000 කට අදාළ පොලී මුදල් අයකර නොගැනීම, අවස්ථා 14 ක දී එකතුව රු.10,754,399 ක මුදලක් ස්ථාපකගේ අනුමැතියකින් තොරව මුදා හැර තිබීම, ගිණුම් වාර්තා සකස් කර විගණනයට ඉදිරිපත් නොකිරීම යන කරුණු හේතුවෙන් භාර ඔප්පුවේ 08, 16, 18 කොන්දේසි කඩ කර තිබුණි.

**(ඇ)** 2012 10.3 **බුදලයක් පවරා ගැනීම**

---------------------------

බුදලයක් පවරා ගැනීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2010 අප්‍රේල් 19 දින අදාළ භාරය දෙපාර්තමේන්තුව භාරයට පත්වීමෙන් පසු බුදලයට අයත් වත්කම් පවරා ගැනීමේ මූලික කටයුතු සඳහා පළපුරුදු හා සුදුසුකම්ලත් නිත්‍ය කාර්යය මණ්ඩලයක් සිටියදී එම කාර්යයන් විධිමත් ක්‍රමවේදයකින් තොරව බාහිර පුද්ගලයකු මගින් ඉටුකරවාගෙන බුදලය සතු මුදලින් රු.1,003,955 ක් වියදම් කර තිබුණි. එම ගෙවීම් සනාථ කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

එම බුදලයට අයත්ව හා බැංකුවක සේප්පුවක තැන්පත් කර තිබුණු රන් භාණ්ඩ හා වටිනා වත්කම් අයිතමයන් 80 ක් පිළිබඳ, අදාළ දෙපාර්තමේන්තු ලිපි ගොනුවල සහ උසාවියට ඉදිරිපත්කර තිබුණු වත්කම් ලේඛනයේ සඳහන් කර නොතිබුණි.

උසාවියට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, බුදල්කරු සතුව පැවති බැංකු ශේෂවල වටිනාකම රු.45,324,443 ක් වුව ද, විගණනය සඳහා ලැබුණු තොරතුරු අනුව එම ශේෂය රු.51,906,005 ක් විය. එසේම බුදල්කරු සතුව පැවති තවත් බැංකු ශේෂයක වටිනාකම රු.304,445 ක් අඩුවෙන් තොරතුරු සඳහන් කර උසාවියට ඉදිරිපත් කර තිබුණි.

ඉහත බැංකු ශේෂයන්ට අමතරව උසාවියට ඉදිරිපත් කරන ලද අනෙකුත් බැංකුවල පැවති එකතුව රු.53,646,470 ක් වූ ශේෂයන් පිළිබඳ විස්තර ඇතුළත් බැංකු වාර්තා මුදල් ලිපිගොනුවලට ඇතුළත් කර නොතිබුණු බැවින් එම ශේෂයන්වල නිවැරදිතාවය පිළිබඳ තහවුරුවක් ද විගණනයට ලබාගත නොහැකි විය.

විගණන දිනය වූ 2012 දෙසැම්බර් 20 දින වන විට අදාළ මුදල් හිමිකරු මියගොස් වර්ෂ 02 යි මාස 08 ක් ගතවී තිබුණ ද ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් වූ පරිදි ඔහු සතුව තිබුණු බණ්ඩාරවෙළ පිහිටි නිවස තුළ සිල්මාතා ආරාමයක් ආරම්භ කිරීමත්, එහි භාවනා පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමත්, යන කටයුතු කොළඹ මහාබෝධි සමාගම සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා මහාබෝධි සංගමයේ නියෝජිතයෙකු ඇතුළත් පුද්ගලයින් 06 දෙනෙකුගෙන් සැදුම්ලත් අධ්‍යක්ෂක මණ්ඩලයක් භාරය පරිපාලනය සඳහා පත් කිරීමත් සිදුකර නොතිබුණි.

**(ඇ)** 2013 4.8 (ආ) **අවිනිශ්චිත ගිණුම**

--------------------

භාර මුදල් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේ නිසි ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් භාර මුදල්වලට අදාළ දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පොළී මුදල් බැරකළ යුතු ආකාරය නිශ්චිතව හඳුනා ගත නොහැකි වීම නිසා ඒ පිළිබඳ තොරතුරු ලැබෙන තෙක් අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබුණි. එම ගිණුමේ තොරතුරු නිශ්චිතව හඳුනාගෙන නිරවුල් නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.6,731,539 ක ශේෂයක් නිරීක්ෂණය විය.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 5 | 4 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 2 | 1 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 46 | 25 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 |
| | **එකතුව** | **70** | **44** | **26** |